සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

2024.02.15

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

Resource Centre
R
De Mazenod College
Kandana
58884

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade: 07
විෂයය / பாடம் / Subject: ඉතිහාසය
පත්‍රය / வினாத்தாள் / Paper: I, II
කාලය / காலம் / Time: පැය 2 යි

නම / பெயர் / Name: ....
විභාග අංකය / சுட்டிலக்கம் / Index No.: ....

- I කොටසේ ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- කොටසේ 1 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සියල්ලටම නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.

I - කොටස

01. අතීතයේ අපේ රටේ සිටි ජනතාව ප්‍රධාන ජීවන වෘත්තිය ලෙස තෝරා ගත්තේ මින් කුමක්ද?
    1. ධීවර කටයුතු 2. කෘෂිකර්මාන්තය 3. වෙළෙඳාම 4. කර්මාන්ත

02. ගිරි නම් ජනපදයේ සහෝදරයින් පස් දෙනෙකු උඳු වැපිරිමට හේනක් සකස් කර ගැනීම පිළිබඳ කතා පුවතක් සඳහන් වන මූලාශ්‍රය වන්නේ
    1. මහාවංසය යි. 2. උම්මග්ග ජාතකය යි. 3. දීපවංසය යි. 4. සද්ධර්මාලංකාරය යි.

03. වාරි කර්මාන්තයට කළ විශිෂ්ට සේවය නිසා මින්නේරි දෙවියන් ලෙස ප්‍රචලිත වූ රජතුමා කවුරුන් ද?
    1. කාවන්තිස්ස 2. දුටුගැමුණු 3. මහසෙන් 4. භාතිකාභය

04. සකපෝරුව භාවිත කරන ලද්දේ මින් කුමන කර්මාන්තයක් සඳහා ද?
    1. ලෝහ කර්මාන්තය 2. පේෂ කර්මාන්තය 3. උක් කර්මාන්තය 4. මැටි කර්මාන්තය

05. පළමුවන සේන රජුගේ කාලයේ දී ශ්‍රී ලංකාවට ආක්‍රමණයක් එල්ල කළ පාණ්ඩ්‍ය රජු කවුරුන් ද?
    1. දෙවන වරගුණවර්මන් 2. රාජ රාජ 3. ශ්‍රී මාර ශ්‍රී වල්ලභ 4. පළමුවන රාජේන්ද්‍ර

06. වැඩිමහල් සහෝදරයාගෙන් පසු බාල සහෝදරයාට රජකම උරුමවීමේ සම්ප්‍රදාය අනුව රාජ්‍යත්වයට පත් රජවරු ඇතුළත් පිළිතුර තෝරන්න.
    1. පණ්ඩුකාභය රජුගෙන් මුටසීව රජු ට 2. දෙවන දප්පුල රජුගෙන් නවවන අග්ගබෝධි රජු ට 3. පළමුවන සේන රජුගෙන් දෙවන සේන රජු ට 4. දුටුගැමුණු රජුගෙන් සද්ධාතිස්ස රජු ට

07. දුඹුටුලු වැව හා තෝපා වැව යන වැව් ඒකාබද්ධ කිරීමෙන් බිහි වූ විශිෂ්ට ම වාරි නිර්මාණය වන්නේ මින් කුමක් ද?
    1. මින්නේරිය වැව 2. පරාක්‍රම සමුද්‍රය 3. කලා වැව 4. තිසා වැව

08. මහා විජයබාහු රජුට ළමා කාලයේ සිටම උපකාර කළ ප්‍රභුවරයා පහත පිළිතුරු අතරින් තෝරන්න.
1. බුද්ධරාජ 2. නගරගිරි කිත්ති 3. දේවපතිරාජ 4. ජගත් විජය

09. • දක්ඛිණ දේශයේ පාලකයා වීම
• පරාක්‍රමපුරය යනුවෙන් අලුත් නගරයක් ඉදිකිරිම
ඉහත කාර්යයන්ට අදාල රජතුමා කවුරුන් ද?
1. මානවම්ම රජු 2. අටවන අග්ගබෝධි රජු
3. මහා පරාක්‍රමබාහු රජු 4. හතරවන පරාක්‍රමබාහු රජු

10. අම්බලන්ගොඩ හා උඩුපිල වැනි ප්‍රදේශ ප්‍රසිද්ධියට පත් ව ඇත්තේ මින් කුමන කර්මාන්තයක් සඳහා ද?
1. පිත්තල භාණ්ඩ තැනීම 2. පැදුරු විවීම
3. වෙස් මුහුණු නිර්මාණය 4. ලාක්ෂා චිත්‍ර කලාව

11. හින්දු ආගමික ජනතාව හා ඉස්ලාම් ආගමික ජනතාව තම ආගමික සිරිත් විරිත්වලට මුල්තැන දෙමින් පවත්වන ආගමික උත්සව දෙකක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
1. නත්තල් සහ රාමලාන් 2. තෛපොංගල් හා රාමලාන්
3. රාමලාන් හා තෛපොංගල් 4. රාමලාන් හා වෙසක්

12. යුනෙස්කෝ සංවිධානය ලෝක උරුමයක් ලෙස නම්කොට ඇති මොහෙන්ජොදාරෝ නගරය පිහිටා ඇත්තේ කුමන රටේ ද?
1. පකිස්ථානයේ 2. ඉන්දියාවේ 3. චීනයේ 4. ඇෆ්ගනිස්ථානයේ

13. ඉබන් බතූතා නම් අරාබි සංචාරකයා ශ්‍රී ලංකාවට පැමිණියේ කුමන රාජධානි සමයේ ද?
1. යාපහුව 2. කුරුණෑගල 3. ගම්පොළ 4. යාපනය

14. ගම්පොල රාජධානියේ අවසාන කාලයේ ශ්‍රී ලංකාව ආක්‍රමණය කළ චීන සෙන්පතියා කවුරුන් ද?
1. කාලිංග මාඝ 2. චෙංහෝ 3. චන්ද්‍රභානු 4. යුංලෝ

15. • රටේ අධ්‍යාපන ප්‍රබෝධයක් ඇති වීම
• උගත් පඬිවරු බිහිවීම
• විශිෂ්ට සාහිත්‍ය කෘති රචනා වීම
ඉහත දක්වන ලද තොරතුරුවලට අදාල රාජධානි යුගය පහත පිළිතුරු අතරින් තොරන්න.
1. පොළොන්නරුව 2. දඹදෙනිය 3. යාපහුව 4. කෝට්ටේ

16. බටහිර වෛද්‍ය විද්‍යාවේ පියා ලෙස සැලකෙන්නේ මින් කවුරුන් ද?
1. ප්ලේටෝ 2. ඇරිස්ටෝටල් 3. හිපොක්‍රටීස් 4. ආකිමිඩීස්

17. රෝම ගෘහ නිර්මාණයේ විශිෂ්ටත්වය පිළිබිඹු කරන විශාල ඉදිකිරීමක් ලෙස සැලකෙන්නේ
1. පැරණි එළමහන් රංග පීයය 2. පැන්තියන් දේවස්ථානය
3. පාතිනන් දෙව්මැදුර 4. මහා නාන තටාකය

- අංක 18 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති ලංකා සිතියම උපයෝගී කර ගනිමින් සුදුසු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.



18. "A" අක්ෂරයෙන් පෙන්නුම් කර ඇති ඓතිහාසික රාජධානිය කුමක් ද?
    1. අනුරාධපුරය
    2. පොළොන්නරුව
    3. මාතලේ
    4. යාපහුව

19. "B" අක්ෂරයෙන් පෙන්නුම් කර ඇති වරාය කුමක් ද?
    1. මහාතිත්ථ
    2. ත්‍රිකුණාමලය
    3. ගාල්ල
    4. කොළඹ

20. "C" අක්ෂරයෙන් පෙන්නුම් කර ඇති ගංගාව කුමක් ද?
    1. මල්වතු ඔය
    2. කැලණි ගඟ
    3. කළු ගඟ
    4. මහවැලි ගඟ

(ලකුණු 20×2=40)

II - කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්යය වේ.
- අනෙකුත් ප්‍රශ්න අතුරින් හතරක් තෝරාගෙන පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

1) පහත A හා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

A

අ) 1) A පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක් ද?
   2) මෙය හමු වී ඇත්තේ කුමන ස්ථානයකින් ද?
   3) මෙය නිර්මාණය කර ඇති ලෝහ වර්ගය කුමක් ද?
   4) මෙහි දක්නට ඇති සංකේතයක් ලියන්න.


A

(ලකුණු 08)

B

ආ) 1) මෙම නිර්මාණය නම් කරන්න.
   2) මෙය පිහිටා ඇති නගරය කුමක් ද?
   3) මෙය කුමන ආගමක් හා සම්බන්ධ ස්ථානයක් ද?
   4) මෙම නිර්මාණය පිහිටා ඇති ප්‍රදේශය පිළිබඳ තොරතුරු සපයා ගත හැකි සාහිත්‍ය මූලාශ්‍රයක් නම් කරන්න.


B

(ලකුණු 08)

2) i. අතීතයේ හේන් හැඳින් වූ නම් දෙකක් ලියන්න.
(ලකුණු 02)
ii. හේන ආරක්ෂා කර ගැනීමට අතීත ගොවීහු අනුගමනය කළ ක්‍රම ශිල්ප දෙකක් සඳහන් කරන්න.
(ලකුණු 04)
iii. වී වැපිරීමේ සිට අස්වනු නෙළා ගන්නා තෙක් ගොයම් ආරක්ෂා කර ගැනීමට අනුගමනය කරන ලද සම්ප්‍රදායික ක්‍රම ශිල්ප දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 05)

3) i. හෝපිටිගමු වෙළෙඳපළ සම්බන්ධ පහත තොරතුරු ලියන්න.
A - නීති පනවා පිහිටුවන ලද සෙල්ලිපිය -
B - එය කරවූ රජතුමා -
(ලකුණු 02)
ii. අතීතයේ ශ්‍රී ලංකාව විදේශ වෙළෙඳ සබඳතා පවත්වා ඇති රටවල් හතරක් නම් කරන්න. (ලකුණු 04)
iii. අතීතයේ ශ්‍රී ලංකාවේ දියුණු විදේශ වෙළෙඳාමක් පැවැති බවට කරුණු දෙකක් සඳහන් කර කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 05)

4) i. අනුරාධපුර යුගයේ වැඩිම කාලයක් මෙරට පාලන බලය හිමි කරගෙන සිටි රජ පෙළපත් දෙකක් සඳහන් කරන්න.
(ලකුණු 02)
ii. අතීත රාජ්‍ය පාලනයේදී රජුට සහාය වූ පහත සඳහන් නිලධාරීන්ගේ කාර්යයන් පිළිවෙළින් ලියන්න.
A - අස අදෙක -
B - අති අදෙක -
C - මහා ලේඛක -
D - රට ලද්දන් -
(ලකුණු 04)
iii. නිශ්ශංකමල්ල රජතුමා මුහුණ දුන් අභියෝග දෙකක් සඳහන් කර ඒවාට සාර්ථකව මුහුණ දීමට කටයුතු කළ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.
(ලකුණු 05)

5) i. අප රටේ සංස්කෘතික උරුමයන් බෙදා දැක්විය හැකි ප්‍රධාන කොටස් දෙක සඳහන් කරන්න.
(ලකුණු 02)
ii. පැරණි අනුරාධපුර නගරයේ දක්නට ලැබෙන ඓතිහාසික වැදගත් කමක් ඇති ස්ථාන හතරක් සඳහන් කරන්න.
(ලකුණු 04)
iii. ශ්‍රී ලංකාවේ පිහිටි සංස්කෘතික උරුම අතරින් සීගිරියේ විශේෂත්වය පිළිබඳ වගන්ති පහක් ලියන්න.
(ලකුණු 05)

6) i. පහත A හා B යටතේ දක්වා ඇති ප්‍රශ්න වලට කෙටි පිළිතුරු ලියන්න.
A - යාපහුව කඳු මුදුනෙහි බලකොටුවක් තනාගෙන සිටි සෙනෙවියා
B - රුහුණේ ගෝවින්ද මලය කඳු මුදුනෙත් බලකොටුවක් තනාගෙන සිටි පුද්ගලයා
(ලකුණු 02)
ii. පහත සේවාවන් සිදු කළ රජවරු කවුරුන් දැයි ඉදිරියෙන් ලියන්න.
A - බෙලිගල දළඳා මැදුරක් ඉදිකිරීම -
B - ඊජිප්තුව සමග වෙළෙඳ සබඳතා පැවැත්වීම -
C - සපුමල් කුමරු යටතේ යාපනය ජය ගැනීම -
D - යාපනය රාජධානියේ ආරම්භක පාලකයා වීම -
(ලකුණු 04)
iii. දෙවන පරාක්‍රමබාහු රජුගේ සේවාවන් කෙටියෙන් විස්තර කරන්න.
(ලකුණු 05)

7) i. ග්‍රීසියේ පැවති පෞර රාජ්‍ය දෙකක් නම් කරන්න
(ලකුණු 02)
ii. පහත තොරතුරුවලට අදාල පිළිතුරු A, B,C, D පිළිවෙලින් ලියන්න.
A ග්‍රීකවරුන් ශ්‍රී ලංකාව හැඳින්වූ නම -
B ග්‍රීසියේ වන්දනාවට පාත්‍ර වූ ප්‍රධාන දෙවඟන -
C ඊනිඩ් පද්‍ය ග්‍රන්ථයේ කතුවරයා -
D රෝමය ගොඩනගන ලදැයි සැලකෙන වීරයා -
(ලකුණු 04)
iii. A ග්‍රීක ශිෂ්ටාචාරයෙන් ලොවට උරුම වූ දායාද තුනක් ලියන්න.
B රෝම ශිෂ්ටාචාරයේ ලොවට උරුම වූ දායාද දෙකක් ලියන්න.
(ලකුණු 05)